හොඳ සිංහල

වි ක ධර්මබන්ධු

ද්/ධ, ක්/ඛ්, ච්/ඡ්, ට්/ඨ්, ත්/ථ්, ප්/ඵ්, ග්/ඝ්, ජ්/ඣ්, ඩ්/ඪ්, බ්/භ් යන අල්ප ප්‍රාණ අකුරු දහයට වෙනස්ව මහාප්‍රාන අකුරු දහය උසුරුවන්නට ඔබට හැකිද? උත්සාහ කර බලන්න. ක්/ඛ්, ග්/ඝ් මට නම් කියවෙන්නේ එක් ම විදියටයි. අල්පප්‍රාන හල් අකුරකට පසුව 'හ්' යෙදීමෙන් මහාප්‍රාන හල් අකුරක් සදා ගත්තත් එය එකිනෙකට වෙනස් ව උසුරු වන්නට නම් ස්වරයකුත් එයට එක් කල යුතුය. ක යන්නේන් ඛ යන්නේත් වෙනස අපට හඳුනා ගත හැක. ට්, ඩ්, ධ්, ච් යන අකුරුවලට ගැටයක් යොදා මහාප්‍රාන අකුරක් හදාගත් පසු හල් ලකුන ද මාරු වේ. ට්/ඨ්, ඩ්/ඪ්, ධ්,ඪ්, ච්/ඡ් ගැටය නිසා 'ට්' යන්න මහාප්‍රාන 'ඨ්' බවටත් 'ඩ්' යන්න මහාප්‍රාන 'ඪ්' බවටත් මහාප්‍රාන 'ධ්' යන්න මහාප්‍රාන 'ඨ්' බවටත් 'ච්' යන්න මහාප්‍රාන 'ඡ්' බවටත් හැරේ. ගැටය නිසා මහාප්‍රාන අකුරක් බවට හැරෙන එක්ම අල්ප ප්‍රාන අකර 'ඩ' යන්නයි. 'ස්' යන්නට වෙනත් තැනක ගැටයක් යොදා 'ෂ්' යන්නත් 'හ්' යන්නට ඉරිත්තක් (කුඩා කඩ-කඩිත්ත මෙනි) යොදා 'භ්' යන්නත් සාදා ගැනේ.

අල්ප ප්‍රාන අකුරු දහයට මොකක් හෝ ලකුණාක් යොදා මහා ප්‍රාන අකුරු සාදා ගත හැකි නම් අපේ යතුරු පුවරුවේ යතුරු (10-1-9) නවයක් අඩු වේ. එය තිතක් නොහොත් ඉරිත්තක් විය හැකිය. අප ළ්,ළ - ැ, ළ - ළ, ඬ්ග් - ඬ්- ඬ්, ඬ්හ්- -ඬ්-ඬ් යන අකුරු සාදා ගෙන ඇති හැටි තේරුම් ගන්න. ඊ් ඬ් - ඬ්ධ්, ඊ,ඬ්ද් - ඬ්ද් යන අකුරු දෙක සාදා ගෙන ඇත්තේ අමුතුම විදියකට ය. වාසනාවකට මෙන් සඤ්ඤක අකුරු පහෙන් හතරක් එක් ම ලකුනකින් සාදා ගෙන ඇත. ග ජ ඩ ද - ඟ, ඡ, ඩ, ඳ ඒ අකුරු හතරයි. ඒ ක්‍රමයටම 'ඹ්බ' ද හදා ගත හැකිව තිබිය දී 'ඹ' හදා ගත්තේ ඇයි දැයි නොදනිමි.

දැනට අප අකුරකට ඉදිරියෙන් (මුලින්) ෙ,ෛ, ොයන ලකුණු තුනත්, අකුරකට පසුව ා, ි, ැ, ෑ, ු, ූ ,ෘ,ෞ,්‍ය යන ලකුණු නවයත්, අකුරකට ඉහලින්', ", ්, ්, '' යන ලකුණු හතරක් අකුරකට පහලින් ු ,ූ, ෘ, ැ, ොයන ලකුනු පහත් යොදන බව ඔබ දනිති. 3 අංකය වැනි ලකුනක් 'ඉ' (ඉස්පිල්ල) වෙනුවටත්, '2' අංකය වැනි කුඩා 'උ' යන්නක් 'උ' (පාපිල්ල) වෙනුවටත් යංසය 'ය' වැනි ලකුනක් රංසය (රකාරාංසය) වෙනුවටත් අකුරට පසුව ා, ි, ැ, ෑ ලියන විදියට) යොදා ගත්වීට යතුරු පුවරු-වේ තවත් යතුරු හයක් පමණ අඩු කර ගත හැකිය. එසේ ම අකුරට පහලින් හිස් අංසක්ද ඇති වේ. එවිට රකාරාංසයම වැනි ලකුනක් හෝ තිතක් යොදා මහාප්‍රාන අකුරු සාදාගත හැකිය. 'ද' යන්නට ද සුලු සැත් කමක් කොට පහටිය ඔසවා 'ය' යන්න මෙන් තැබිය හැකිය.

මෙහි දැක්වූයේ අදහසක් පමණි. කාලයා විසින් මේ පෙරලිය ඇති කරනු ඇත. එතෙක් මම මහාප්‍රාණ වෙනුවටත් ශ/ෂ වෙනුවටත් තනි පෙරලි කොමාව බහවිතා කරමි. එවිට අපට නොකියවෙන 'ශ්‍රී' වෙනුවටත් කියවෙන 'ෂෝ' වෙනුවටත් මා ලියන්නේ 'ෂ්‍රී', ',' 'සෝ' යන අකුරු දෙකයි. මා ලියූ සැටි නොතකා තම තමන්ගේ දැනුම අනුව මහාප්‍රාන අකුරු ශ/ෂ, ණ, ළ යොදා කියවන මෙන් ගෞරව පූර්වකව ඔබෙන් ඉල්ලමි.

පසුගිය සන්නසෙන් ඉදිරිපත් කරන ලද වැකි පහ අපි පලමු කොට විමසමු.

'අගේ ඉදං කන කනවා' මේ වැකියේ ඇති අග හෝ කන මෙහි තේරුමට සම්බන්ධ නැත. අං ඇති සතකුගේ අගේ රැඳී සිටිමින් ඒ සතාගේ කන කන කින්තුල්ලකු ඇට මැස්සකු මෙහි දී සිහියට නැගේ. සමහර විට කපුටකු නොහොත් මයිනකු ලෙසද සිතා ගත හැකිය. කනවා යනු ලේ බීම හෝ කෙටීමයි. උන් එය කරන්නේ සතුරු කමකට නම් නොවේ. එහෙත් හිතවත්කම පෙන්වා තමා ඇසුරට පැමිණ යටින් තමාට සතුරු කම් කරන කෙනකු ගැනය.
මෙයින් කියවෙන්නේ මිනිසා එය කරන්නේ ලාබ ප්‍රයෝජනයකට වඩා පලි ගැනීමේ අරමුනින් යයි සිතමි. උඩින් මිතුරු යටින් කතුරු, දිය යටිං ගින්දර ගෙනියනවා වැනි කියමන්ද මීට සමාන තේරුම් දෙන බව පෙනේ.

'අපට පයට පෑගෙන රැවිල නෑ නේ' රැවිල වචාපු මුත්තලා ඔබ දැකලා ඇති නොවැ ඉ මුත්තලා සමනියෙන් හැට පැනපු අයයි. එසේම බොහෝ ඇසූ පිරු තැන් ඇති අයයි. ඔවින්ගේ අවවාද පිලිගැනීම අපේ ඇඟට ගුනය. ඔවින්ගේ අවවාද පිටුදැකීම සමහර විට කරදර ඇතිවීමට හේතු වේ.
ඔබ රුසිවරුන්ගේ රූප දැක ඇති නේ. රිසිවරු ඉසිවරු කියන්නේත් රුසිවරුන්ටමයි. ඔය ඉස්සන්ට ඇත්තේ සුදු දිග රැවිලකි. ඉස්සේ බොහෝ දේ දනිති. ඔහු ඉන්දියාවේ විසූහ. නක්සස්ත්‍රය, ජෝතිසාස්ත්‍රය, ආයුර්වේදය, මන්තර ගුරුකම් ආදිය ඉස්සන්ගේ නිපදවීම් බව කියති. ඔහු මහ දැනුම් ඇත්තෝ (මහදැනමුත්තෝ) ය. ඔවින් කියාපු දේ අප පිලිගත යුතුය. අප විවාහ වන්නේ කේන්දර ගැලපේ නම් පමනි. විවාහය කඩාකප්පල්වීම, දරුවන් නොලැබී යෑම, කනවැන්දුම්වීම සිදුවන්නේ කේන්තර නොබලා හිතුවක්කාර විදියට යුග දිවි ඇරඹූ අයටයි කේන්තර බලා යුගදිවි අරඹන්නේ සතුටින් යහනින් චිරාත් කාලයක් ජීවත් වෙති. යම් කෙනකු අනෙකකු කියූ දේ නාසා ඊට පටහැනි ව යමක් කොට වැරදුනු විට මේ රූඩිය ගැලපේ. අපේ අම්මා ඔය ඇනුම් පදයි මට නිතර කියා තිබේ. නාහෙට නාහන එකාට ඔහොම වෙලා මදි. කිව්ව නාහන එකා ඉහල යනත් පල, පහල යනත් පල යනු ඊට සමාන තේරුම් ඇති ඇනුම් පද ය. කෙසේ වෙතත් මුලින් කී රූඩිය බොහෝ ගැඹුරු මිහිරි අර්තවත් එකකි.

අඬුව තියෙද්දී අත පුච්චා ගැනීම අනුවන කමකි. කවර වැඩක් උවත් පරිස්සමෙන් කිරීම කාටත් හොඳය. මා වැඩක් වරද්දා ගැනීම මට පමනක් නොව මගේ අඹු දරු-වන්ටද කරදරයකි. පහසු හොඳ ක්‍රමය තිබියදී වැඩය අනා ගැනීම අඬුව තියෙද්දී අත පුච්චා ගැනීමකි. අමාරුවේ නොවැටී

අල්ප ප්‍රාන අකුරු දහයට මොකක් හෝ ලකුණක් යොදා මහා ප්‍රාන අකුරු සාදා ගත හැකි නම් අපේ යතුරු පුවරු-වේ යතුරු (10-1-9) නවයක් අඩු වේ.

පරෙස්සමින් වැඩ කල යුතු බව මේ රූඩියේ අදහසයි.

කට බොරු කීවත් දිව බොරු කියන්නෑ බොරු කීම පස් පවින් එකකි. තිස්ස කුමාරයා ඇඳයට හංගා ගැමුනු කුමාරයාට ඔහු ඇඳෙහි නැතැයි යතිවරුන් පැවසුවේ බොරු කීම පාපය-ක් නිසාලු. මට ඒ සිල් පදය රැකිය නොහැකිය. මම නිතර ම බොරු කියමි. එහෙත් ඉතා පරිස්සමිනි. බොරුව එලි උනොත් මා බොරු කාරයකු වන නිසා ය ඒ. එහෙයින් නොකර සිටින නොහැකි යමක් නොකරන්නෙමියි මම කිසිදාක පොරොන්දු නොවෙමි ඒ සිල් පදය කීමෙන් ම මා බොරු කාරයකු වන බව මම දනිමි. ගිය සතියෙ මට උන. ගෙයං එලියට බැස්සේ නෑ. කියුවකු පසුව ඊයේ නිහල්ලෑ ගෙදර පාටියක්. ලංකාවෙං ගෙනාපු පොල් අරක්කුත් තිබුනා. මාත් හතර ගාතෙං ගෙදර ආවේ ඉ යනුවෙන් කීම. 'කට බොරු කීවත් දිව බොරු කියන්නෑ' රූඩියට ගැලපෙන උදාහරනයකි.

බොරුකීම බොහෝ පරිස්සමෙන් කල යුතුය. එක් බොරුවක් වසන් කිරීමට තව බොරු දහයක් කීමට සිදු වෙතැයි කියති. 'ඇට නැති දිව කොය් පැත්තට හරවන්න බැරිද ' යනු ඉහත කී රූඩියේ විරුද්ද තේරුම දෙන්නකි. ''දැන් උන්ට සිංහල මතක නැති වෙලා'' සිංහලය අපේ මව් බසයි. අපට එය කිසිදාක අමතක නොවේ. එසේම අමතක කල යුතු ද නැත. එය කිරීමට සිදුවීම අවාසනාවකි. පවකි. සිංහල නොදන්නා සිංහලයාට සිංහලකම ඉක්මනින් අහිමි වේ. ඔහුගේ ජාතිය, අසිංහල ය. මේ රූඩියේ අදහස එසේ සිංහල බාසාව අමතක වූ කෙනකුට සම්බන්ද නැත. අතීතය අමතකවීම හෙවත් මුල මතක නැති වීම මෙහි අදහසයි. සිංහල අමතක වූ ඇත්තන් ඔස්ටේලියාවේ සිටින බව සමහරු කියති. ඔවුන්ට සිංහල බාසාව මතකය. එහෙත් මුල මතක නැත.

සමහරුන්ට ගෝවා කොල, දියබෙරලිය කොල, මැල්ලුම, තක්කාලි කිරිහොද්ද, අමු ඇඹ මාලුව දැන් කන්නට බැරිය. කොටිම්ම ලංකාවේ ගත කල ජීවිතය ඔවින්ට දැන් පිලිකුල්ය. ඒ යුගය මතක් කිරීම ද වදයකි. පොලවේ පය නොගසා අහසිං යන අපේ ඇත්තන් ඉටු විට 'ඒ ඇත්තන්ට (උන්ට) දැං සිංහල මතක නෑ' ය් කෙනකුට සිතෙන්නට බැරි නැත. 'දැං උංගෙ ඔලුව ලොකුයි' යනු ඒ තේරුම ඇති තවත් රූඩියකි.

මීළඟ පාඩමෙන් අපි අලුත් රූඩි පහක් ඉගෙන ගනිමු.
1. ඌ මගේ බත් පතේ වැලි දැම්මා
2. උන්ට කත් අදින්න උඹට ලැජ්ජා නැද්ද (ඛං)?
3. අන්න උඹට උං පදයක් හදලා
4. උං අපේ දැලට අනු උනා.
5. ඌ දැං ඉන්නේ වැට එලිපත්ත උඩ

නොවැළැක්විය හැකි හේතු මත "කෙරටුවේ ගෙදර අප්පුහාමිගේ හෑල්ල" හා තුසිත් අබේනායක ලියන "සංහිඳ" මෙවර පළ නොවන බව කරුණාවෙන් සළකන්න.

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

Professional, Quality Service Assured

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila